මගේ අංකය: JSC/SEC/CIR- L/2022

**අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක : 08/2022**

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
සියලුම අධිකරණ නිලධාරීන්,
සියලුම කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන් සහ
රෙජිස්ට්‍රාර් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත,

**අධිකරණ මඟින් එවනු ලබන සිහිකැඳවීම් ලිපි සම්බන්ධයෙනි.**

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි, මේ සමඟ අමුණා ඇති, ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව මඟින් අධිකරණ සේවා කොමිෂන් සභාවට පිටපතක් සහිතව, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමු කර ඇති අංක **GAD/GA/R/2022/01** හා 2022.03.07 දිනැති ලිපිය ඔබගේ අවධානයට ලක් කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2022 ජූලි මස 12 වන දින
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
அரசாங்க இரசாயனப் பகுப்பாய்வாளர் திணைக்களம்
**GOVERNMENT ANALYST'S DEPARTMENT**

අංක 31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල.
இல. 31, இசுறு மாவத்தை, பெலவத்த, பத்தரமுல்ல.
No. 31, Isuru Mawatha, Pelawatta, Battaramulla.
SRI LANKA.

දුරකථන / தொலைபேசிகள் / Telephones: 011 - 2786395, 011 - 2176800
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2786394
*E-mail* : govanalyst@sltnet.lk

මගේ අංකය / எனது இல. / My No. GAD/GA/R/2022/01
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2022.03.07

ලේකම්,

අධිකරණ අමාත්‍යාංශය,

කොළඹ 12.

<u>අධිකරණ මඟින් එවනු ලබන සිහිකැඳවීම් ලිපි සම්බන්ධයෙනි.</u>

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත විවිධ අධිකරණ වලින් එවන ලද නඩු භාණ්ඩ සම්බන්ධයෙන් වාර්තා නිකුත් කිරීම පිණිස සිහිකැඳවීම් ලිපි රාශියක් දින පතාම ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලැබෙමින් පවතී. ඉන් අනතුරුව අදාල අංශ වෙත එම ලිපි යොමු කරනු ලැබේ.

එවනු ලබන එම සිහිකැඳවීම් ලිපි පරීක්ෂා කිරීමේදී ඒවා අතරින් බොහෝ වාර්තා ඒ වන විටද ලියා පදිංචි තැපැල් මඟින් අදාල මහේස්ත්‍රාත් අධිකරණ/ දිසා අධිකරණ/ මහාධිකරණ වෙත යවනු ලැබූ ඒවා වේ. මෙසේ නැවත නැවතත් වාර්තා පිටපත් අධිකරණවලට නිකුත් කිරීමට සිදු වීමේදී ඒ වෙනුවෙන් මුදල් ද විද්‍යාත්මක නිලධාරීන්ගේ කාලය ද අනවශ්‍ය ලෙස වැයවීම සිදුවේ.

ඉහත කරුණු සලකා බලා අදාල අධිකරණවලට යවනු ලබන වාර්තා අස්ථාන ගත වීම වැලැක්වීම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසට අදාල අධිකරණ දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ආණ්ඩුවේ රස පරීක්ෂක,

පිටපත:- සභාපති,
අධිකරණ සේවා කොමිසම් සභාව,
අළුත්කඩේ,
කොළඹ 12.
- කරු.දැ.ග.ස.